MONEY
&
FINANCIAL INSTITUTIONS
(Part-I)

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura

මුදල්

භාණ්ඩ හා සේවා හුවමාරුවේ දී පොදුවේ පිළිගනු ලබන ඕනෑ ම දෙයක් මුදල් වශයෙන් සලකයි.

හුවමාරුව සඳහා මුදලේ අවශ්‍යතාව

- අතීතයේ මුදල් නො මැති ව සිදු වූ සෘජු හුවමාරුව භාණ්ඩ හුවමාරුව නම් විය.

- භාණ්ඩ හුවමාරුවේ දී විවිධ දුෂ්කරතා පැවතිණි.

- එබැවින් භාණ්ඩ හුවමාරුව වෙනුවට සැම දෙනා ම පිළිගන්නා පොදු මාධ්‍යයක අවශ්‍යතාව දැණුනි.

- එම හුවමාරු මාධ්‍ය මුදල් ලෙස හැඳින්විය.

- ඒ අනුව හුවමාරුව සඳහා මුදල් අවශ්‍ය බව පැහැදිලි වේ.

ClassWork.LK

මුදලේ කාර්යයන්

- විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම (A medium of exchange)

- වටිනාකම මැනීමේ මිනුම් දණ්ඩක් ලෙස කටයුතු කිරීම (standard of value)

- වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම (store of value)

- විලම්බිත ගෙවුම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම (Deferred payments)

ClassWork.LK

විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම

භාණ්ඩ හා සේවා හුවමාරුවේ දී අතරමැදියෙකු වශයෙන් කටයුතු කිරීමයි. නැතහොත් භාණ්ඩ හා සේවාවල මිල ගෙවනුයේ මුදල් මගිනි.

නිදසුන් :
රු. 30,000 ක ජංගම දුරකථනයක් මිල දී ගැනීම

වටිනාකම මැනීමේ මිනුම් දණ්ඩක් ලෙස කටයුතු කිරීම

භාණ්ඩ හා සේවාවන්හි වටිනාකම හෙවත් අගය මැනීම සඳහා මුදල් භාවිත කිරීමයි. මෙය මිල (price) නම් වේ. මෙමගින් ගිණුම් තැබීම පහසු වී ඇති නිසා මෙය ගිණුම් ඒකකයක් (unit of Account) ලෙස ද හඳුන්වයි.

නිදසුන් :
සපත්තු ජෝඩුවක් රු. 1999.90 ක් ලෙස මිල කිරීම

ClassWork.LK

වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම

මුදල් රැස් කර තබා ගත හැකි ය. කාසි හා නෝට්ටු යල් පැනීමකින් තොර ව ක්ෂය වීමකින් තොර ව රැස් කර තබා ගනිමින් අනාගතයේ දි භාණ්ඩ හා සේවා මිලට ගැනීමට භාවිත කළ හැකි ය.

නිදසුන් :
රු. 10,000 ක මුදලක් ඉතිරි කිරීම

විලම්බිත ගෙවුම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම

අනාගත මුදල් ගෙවීමක් සඳහා වර්තමානයේ ගිවිස ගත හැකි ය. එනම් ඉදිරි දිනයක දී මුදල් ගෙවීමේ කොන්දේසි යටතේ භාණ්ඩ හා සේවා මිල දී ගත හැකි විමයි.

නිදසුන් :
2016 ජනවාරි මස රු.5000 කට මිලට ගත් භාණ්ඩ තොගයක් සඳහා 2016 මාර්තු මස මුදල් ගෙවීමට ගිවිස ගැනීම.

ClassWork.LK

හොඳ මුදලක ලක්ෂණ

- පොදු පිළිගැනීමක් තිබීම
- කල්පැවැත්මක් තිබීම
- අනුකරණයේ දුෂ්කරතාව
- පහසුවෙන් ගෙන යා හැකි වීම
- පහසුවෙන් හඳුනාගත හැකි වීම හෙවත් සමජාතීය බව
- කුඩා කොටස්වලට බෙදිය හැකි වීම

ClassWork.LK

මුදල් වර්ග

ව්‍යවහාර මුදල් (currency)

මූල්‍ය අධිකාරියේ නියෝග මත නිකුත් කරන කාසි හා නෝට්ටු මෙලෙස හඳුන්වයි. ව්‍යවහාර මුදල් වලංගු මුදල් ලෙස ද හඳුන්වන අතර මේවායේ ද්‍රවශිලතාව 100% කි.

නිදසුන් :
කාසි හා නෝට්ටු

බැංකු මුදල් (Bank Money)

වාණිජ බැංකු පවත්වා ගෙන යන ඉල්ලුම් තැන්පතු හෙවත් ජංගම ගිණුම්වල ශේෂ බැංකු මුදල් වේ. මෙම මුදල් ගෙවීම් කටයුතු කරන්නේ චෙක්පත් හරහා ය. ව්‍යවහාර මුදල් මෙන්
ද්‍රවශීලතාව 100% ක් ම නැතත් ආසන්න මුදල්වලට වඩා ද්‍රවශීලතාවෙන් යුක්ත වේ.

නිදසුන් :
වාණිජ බැංකුවල ඇති ජංගම ගිණුම් තැන්පතු

ClassWork.LK

ආසන්න මුදල් (Near Money)

ව්‍යවහාර මුදල් මෙන් 100% ක් ද්‍රවශලී තාවෙන් යුක්ත නොවූ එහෙත් වටිනාකමේ සන්නිධියක කාර්ය ඉටු කරනු ලබන පහසුවෙන් මුදල් බවට පත් කළ හැකි වත්කම් ය.

නිදසුන් :

වාණිජ බැංකුවල ඇති මහජනයා සතු කාලීන හා ඉතුරුම් තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් , වාණිජ පත්‍රිකා

ClassWork.LK

විද්‍යුත් මුදල් (E-money)

තොරතුරු හා ඩිජිටල් තාක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස බිහි වී ඇති දේශීය මෙන් ම ජාත්‍යන්තර ගනුදෙනුවල දී ද ගෙවීම් කිරීමට යොදා ගනු ලබන මුදල් ය.

නිදසුන් :

හර කාඩ්පත් (debit card)

ගෙවනු ලබන මුදල් ප්‍රමාණය විද්‍යුත් ලෙස ගිණුමට හර වන, බැංකු ගිණුමේ මුදල් තිබෙන අයට පමණක් ලබා ගත හැකි කාඩ්පත් ය.

ClassWork.LK

ණය කාඩ්පත් (credit card)

බැංකු ගිණුමක් නො මැති වුව ද ණය වශයෙන් භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා මෙන් ම මුදල් ලබා ගැනීම සඳහා ද භාවිත කරන කාඩ්පත් විශේෂයකි.

පෙර ගෙවුම් කාඩ්පත් (prepaid card)

කලින් මුදල් ගෙවා ලබා ගත හැකි කාඩ්පත් ය.

ClassWork.LK

කාඩ්පත් මගින් ගෙවීම් කිරීම පහසු කිරීම සඳහා යොදා ගන්නා සේවාවන් (පහසුකම්)

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර

(ATM යන්ත්‍ර - Automatic Teller Machines)

ස්වයංක්‍රීය තැන්පතු යන්ත්‍ර

(ADM යන්ත්‍ර -Automatic Deposits Machines)

චෙක්පත් තැන්පතු යන්ත්‍ර

(CDM යන්ත්‍ර - Cheques Deposits Machines)

වෙළෙඳසැල් ගෙවීම් විද්‍යුත් පැවරුම් ජාල

(Electronic funds transfer point of sales)

ටෙලි බැංකු පහසුකම්

(Tele banking)

අන්තර්ජාල බැංකු කටයුතු

Internet banking / Online banking

ටෙලිවිෂන් බැංකු පහසුකම්

Televission banking

ClassWork LK


පළමු මස
නොමිලේ...
2022
ADVANCED
LEVEL
BUSINESS
STUDIES
MASS CLASS
ONLINE CLASS
ZOOM තාක්ෂණය ඔස්සේ...
මාර්තු
27
ලියාපදිංචි වීමට :-
076 36 55 550
ඉරිදා
උදෑසන 11.00
සුපුන් මදුශංක
B.sc.(Mgt) Accounting (Special) (U.G.)
University of Sri Jayewardenepura